HUMAN RIGHTS WATCH

# “පසැඟිලි සියල්ල ඒකාකාර නැත”

## ශ්‍රී ලංකාවේ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම් වූ විෂම සැලකීම

Copyright © 2016 හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch)
සියළුම හිමිකම් ඇවිරිණි.
මුද්‍රණය කරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේදීය.
ISBN: 978-1-6231-33931
කවරය සැකසීම රෆායල් ජිමෙන්ස් විසිනි.

හියුමන් රයිට්ස් වොච් සංවිධානය ලොව වටා ජීවත් වන පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරයි. අපි, අපයෝජන පිළිබඳව පරීක්ෂාවෙන් විමර්ශනය කර, පුළුල් ලෙස කරුණු හෙළිදරවු කරමින්, අයිතීන් වලට ගරු කිරීමට සහ යුක්තිය සුරක්ෂිත කිරීමට බලය ඇති පුද්ගලයන්ට බල කර සිටින්නෙමු. මානව ගරුත්වය ආරක්ෂා කිරීම සහ සෑම පුද්ගලයෙකුමට සමාන හිමිකම් සහතික කිරීම සඳහා වන ජීවමාන ව්‍යාපාරයක කොටසක් ලෙස ක්‍රියා කරන හියුමන් රයිට්ස් වොච් සංවිධානය, ස්වාධීන ජාත්‍යන්තර සංවිධානයකි.

හියුමන් රයිට්ස් වොච් සංවිධානය, රටවල් 40 කට වඩා වැඩි ප්‍රමාණයක සේවක කණ්ඩායම් සිටින, සහ ඇම්ස්ටර්ඩෑම්, බේරූට්, බර්ලින්, බ්‍රසල්ස්, චිකාගෝ, ජිනීවා, ගෝමා, ජොහැන්නස්බර්ග්, ලන්ඩන්, ලොස් ඇන්ජලීස්, මොස්කව්, නයිරෝබි, නිව්යොක්, පැරිස්, සැන් ෆ්‍රැන්සිස්කෝ, සිඩ්නි, ටෝකියෝ, ටොරොන්ටෝ, ටියුනීස්, වොෂිංටන් ඩීසී සහ සූරික් යන නගර වල කාර්යාල සහිත ජාත්‍යන්තර සංවිධානයකි.

වැඩි දුර විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න: http://www.hrw.org

# "පසැඟිලි සියල්ල ඒකාකාර නැත"
## ශ්‍රී ලංකාවේ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම් වූ විෂම සැලකීම


වචන මාලාව ........ i

සාරාංශය ........ 1
සමාජීය ස්ත්‍රී පුරුෂභාවට ඇති නෛතික පිළිගැනීම ........ 2
නීතිය මගින් ආරක්ෂා නොවීම ........ 3
සමාජීය ස්ත්‍රී පුරුෂභාවයට අනුගත නොවීම පිළිබඳ වූ විෂම සැලකීම ........ 3

සම්පූර්ණ නිර්දේශ ........ 5
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ........ 5
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පාලන කමිටුව වෙත ........ 5
අධිකරණ අමාත්‍යාංශය වෙත ........ 5
සෞඛ්‍යය අමාත්‍යාංශය වෙත ........ 6
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ........ 7
නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත ........ 7
පොලීසිය වෙත ........ 7
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තුමේන්තුව වෙත ........ 8
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව, ආගමන විගමන දෙපාර්තුමේන්තුව වෙත ........ 8
ජාතික ලිංගාශ්‍රිත රෝග/ ඒඩ්ස් මර්දන වැඩසටහන වෙත ........ 9
ජාතික මානව හිමිකම් කවුන්සිලය වෙත ........ 9
ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලය, වෛද්‍ය සංගමය සහ මනෝ චිකිත්සක පාසල වෙත ........ 9

# වචන මාලාව

**(Bi Sexual) ද්වි ලිංගික:** ලිංගික සහ ප්‍රේමණීය වශයෙන් සමාන ලිංගයක් සහිත පුද්ගලයෙකු වෙත හෝ විරුද්ධ ලිංගයේ පුද්ගලයන් වෙත ආකර්ශනයක් දක්වන පුද්ගලයන් මින් අදහස් වේ.

**(Cisgender) සිස් සමාජභාවී:** (තෝරා ගැනීමට හැකියාව ඇති විට ප්‍රකාශ කරන හෝ ප්‍රකාශ කිරීමට කැමති ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය) උපතේදී නිර්ණය කරන ලිංගික අවයව වලට අනුරූප එකක වන පුද්ගලයන් හැඳින්වීමට යෙදෙන විශේෂණ පදයකි.

**(Gay) සමරිසි පුරුෂයා:** මූලික වශයෙන් ලිංගික සහ ප්‍රේමණීය වශයෙන් පිරිමින් වෙත ආකර්ශනයක් දක්වන පිරිමින් මින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ සමකාමී පිරිමින් ලෙසද මොවුන් හැඳින්වේ

**(Gender) සමාජීය ස්ත්‍රී පුරුෂභාවය:** පිරිමින් සහ කාන්තාවන් සමාජයේ හැසිරිය යුත්තේ කෙසේදැයි සමාජය විසින් තීරණය කර තිබෙන ආකාරයයි. සමාජයීය ස්ත්‍රී - පුරුෂ භාවයෙන් කියවෙන්නේ පිරිමින් සහ ගැහැණුන් වශයෙන් අපේ භූමිකාව, ක්‍රියාකාරකම්, අප සමාජයේ හැසිරෙන ආකාරය සහ අපෙන් බලාපොරොත්තු වන දේවල් වේ. සමාජයීය ස්ත්‍රී - පුරුෂ භාවය යනු ලිංගික අයවය අනුව තීරණය කරන ලද ස්ත්‍රී පුරුෂ භාවය නොවේ.

**(Gender Identity) සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය:** තමන් පුරුෂාකාරද ස්ත්‍රී ආකාරද සහ පුරුෂයෙකුද ස්ත්‍රියක්ද යන්න පිළිබඳ ඇති ස්වයං අවබෝධය හෝ මූලික හැඟීම මින් අදහස් වේ. එනම්, තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ඇති අවබෝධයයි.

එය උපතේදී තීරණය කරන ලද ස්ත්‍රී පුරුෂභාවයට අනුකූළ විය යුතු නැත.

**(Gender non-conforming) සමාජීය ස්ත්‍රී පුරුෂභාවන්ට අනුගත නොවීම:** ලිංගික අවයව වලට අනුරූප සමාජය විසින් ලබා දී ඇති හැසිරීම් සහ භූමිකා වලට සම්පූර්ණයෙන්ම අනුගත නොවන පුද්ගලයන් හැඳින්වෙන යෙදුමකි.

**(Homophobia) සමලිංගිකභීතිකාව:** සම ලිංගික හෝ/ සහ සහ ලිංගිකත්වය කෙරෙහි වූ වෙනස් කොට සලකන සුළු ආකල්ප හරහා බොහෝ විට ගොඩනැගෙන බිය, ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිකුළ මින් අදහස් වේ.

**(Homosexual) සමලිංගික: මූලික වශයෙන්** ලිංගික සහ ප්‍රේමණීය වශයෙන් සමාන ලිංගයක් සහිත පුද්ගලයෙකු වෙත ආකර්ශනයක් දක්වන පුද්ගලයන් මින් අදහස් වේ.

සිංහල භාෂාවෙන් සම රිසි සහ සම කාමී පුද්ගලයන් ලෙස ද මොවුන් හැඳින්වේ.

**(Intersex) අන්තර්ලිංගික:** කාන්තා ප්‍රජනක සහ ලිංගික අවයව හෝ පුරුෂ ප්‍රජනක සහ ලිංගික අවයව වශයෙන් පොදුවේ පිළි ගන්නා නිර්වචනයට වඩා වෙනස් ආකාරයට ලිංගික හා ප්‍රජනක අවයව පිහිටන පුද්ගලයන් මෙනමින් හැඳින්වේ.

**(LGBT)** සම ලිංගික කාන්තාවන්, සම ලිංගික පිරිමින්, ද්වි ලිංගික පුද්ගලයන් සහ සංක්‍රාන්ති පුද්ගලයන් හැඳින්වීමට ඉංග්‍රීසියෙන් යෙදෙන පද වල කෙටි නාමයකි. ලිංගික සුළුතර ප්‍රජාව සහ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී සුළුතර ප්‍රජාව යනුවෙන් හැඳින්වෙන අනන්‍යතාවයන්ට අදාල කණ්ඩායම්ද මෙයට ඇතුළත් වේ.

**(LGBTI) සම ලිංගික කාන්තාවන්, සම ලිංගික පිරිමින්, සංක්‍රාන්ති පුද්ගලයන් සහ අන්තර් ලිංගික පුද්ගලයන්**

**(Lesbian) සම රිසි කාන්තාවන්:** මූලික වශයෙන් ලිංගික සහ ප්‍රේමණීය වශයෙන් කාන්තාවන් වෙත ආකර්ශනයක් දක්වන කාන්තාවන් මින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ සමකාමී කාන්තාවන් ලෙසද හැඳින්වේ.

**(Men who have sex with Men (MSM)) පුරුෂයන් සමඟ ලිංගිකව හැසිරෙන පුරුෂයන්**
තමන් සම ලිංගික හෝ ද්වි ලිංගික ලෙස හඳුන්වා නොගන්නා, පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් හැඳින්වීමට භාවිත වේ.
මොවුන් කාන්තාවන් සමගද ලිංගික සම්බන්ධතා පවත්වනවා වන්නට පුළුවන්.

**(Sexual and Gender Minorities) ලිංගික සහ සමාජීය ස්ත්‍රී පුරුෂ භාවී සුළුතරය**: සම ලිංගික කාන්තාවන්, සම ලිංගික පිරිමින්, ද්වි ලිංගික පුද්ගලයන්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්, සමාජීය ස්ත්‍රී පුරුෂභාවන්ට අනුගත නොවන පුද්ගලයන්, පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් සහ කාන්තාවන් සමග ලිංගිකව හැසිරෙන කාන්තාවන් ඇතුළු සමාජීය ස්ත්‍රී පුරුෂභාවන්ට සහ ලිංගිකත්වයන්ට අනුගත නොවන සියළුම පුද්ගලයන් හැඳින්වීමට යෙදෙන වචනයකි.

**(Sexual Orientation) ලිංගික දිශානතිය:** පුද්ගලයෙකුගේ ප්‍රේමණීය සහ ලිංගික කැමැත්ත හඳුනා ගන්නා ආකාරයකි. යම් පුද්ගලයෙකු ලිංගික වශයෙන් ආකර්ශනය වන්නේ සමාන ලිංගයේ පුද්ගලයෙකු වෙතද, විරුද්ධ ලිංගයේ පුද්ගලයෙකු වෙතද, දෙපාර්ශවයේම පුද්ගලයන් වෙතද, ඒ කිසි කෙනෙකු වෙත ආකර්ශනය නොවන්නේද යන්න මෙම යෙදුම මගින් විස්තර වේ.

**(Sex Reassignment Surgery (SRS)) ලිංග සැකසීමේ සැත්කම:** යම් පුද්ගලයෙකුගේ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාව වඩාත් හොඳින් පරාවර්තනය වන ආකාරයට ශරීරය සකස් කිරීමේ ශෛල්‍යකර්ම හැඳින්වෙන්නේ මෙනමිනි. ඇතැම් පුද්ගලයන් සඳහා මෙම ශෛල්‍යකර්ම සිදුකිරීම වෛද්‍යවිද්‍යානුකූලව අවශ්‍යය. කෙසේ වුවත් සෑම පුද්ගලයෙකුම සංක්‍රාන්තියේ කොටසක් ලෙස සැත්කම් සඳහා යොමු විය නොහැකි අතර සෑම සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙකු සැත්කමක් ඉල්ලා සිටින්නේ ද නැත.

**(Sex work) ලිංගික වෘත්තිය :** කැමැත්තෙන් එකඟ වන වැඩිහිටියන් අතර වාණිජමය වශයෙන් ලිංගික සේවා හුවමාරුව.

**(Transgender (also "trans")) සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්**: (සංක්‍රාන්ති පුද්ගලයන් ලෙසද හැඳින්වේ) ස්වකීය සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය (තෝරා ගැනීමට හැකියාව ඇති විට ප්‍රකාශ කරන හෝ ප්‍රකාශ කිරීමට කැමති ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය) උපතේදී ලබා දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය හා අනුරූප නොවන පුද්ලයන් හැඳින්වීමට යොදා ගැනේ. සංක්‍රාන්ති පුද්ගලයෙකු සාමාන්‍යයෙන් තමන් තෝරා ගන්නා සමාජීය ස්ත්‍රී පුරුෂභාවයට අනුරූප සමාජීව ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනයක් තෝරා ගනී. එසේත් නැතිනම් තෝරා ගැනීමට කැමතිය. නමුත්, තමන් තෝරා ගන්නා ස්ත්‍රී

පුරුෂ සමාජභාවී අනන්‍යතාවයට අනුරූප වන සේ ශරීරයේ අංග ලක්ෂණ වෙනස් කරන්නේ නැති වන්නට පුළුවන.

(**Transphobia**) **සංක්‍රාන්ති භීතිකාව:** සාමාන්‍යයෙන් සෘණාත්මක ඒකාකෘති මත පදනම්ව, සංක්‍රාන්ති සමාජභාවයක් සහිත පුද්ගලයන්, කෙරෙහි පවතින බිය හෝ වෛරය හෝ විෂම සැලකීම.

# සාරාංශය

ඇගිලි පහම එක වගේ නෑ.... මනුෂ්‍යයන්ට ගෞරව කළ යුත්තේ ඔවුන් මනුෂ්‍යයන් නිසයි.
—තෙහාන්, 43 වියැති සම ලිංගික පුරුෂයෙක්, කොළඹ, 2015 නොවැම්බර්

ශ්‍රී ලංකාවේ ගැහැණු - පිරිමි කියලා රාමු දෙකක් තියෙනවා. පිරිමියෙක් විදියට ඉපදුණොත් එය වාසනාවක් ලෙසයි සමාජය සිතන්නේ. ඒ පිරිමිකම අතහරිනවා නම් එය පවුකාරකමක්.
—භූමි, 25 වියැති සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක්, කොළඹ, 2015 ඔක්තෝබර්

ඒ අයගේ වචන ඉදිකටු වලටත් වඩා තියුණුයි.
—ක්‍රිෂාන්, 40 වියැති සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙක්, කොළඹ, 2015 ඔක්තෝබර්, රජයේ රෝහල් වල සහ සායන වල සේවකයන් පිළිබඳ විස්තර කරමින්

කාන්තාවන් සහ පිරිමින් ගේ බාහිර පෙනුම සහ හැසිරෙන ආකාරය පිළිබඳව ඇති අදහස් ශ්‍රී ලංකාවේ ගැඹුරින් ස්ථාපිත වී ඇත .බොහෝ සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික (LGBTI) පුද්ගලයන් ඇතුළු සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රතිමානයන් අභියෝගයට ලක් කරන පුද්ගලයන්, රාජ්‍ය නිලධාරීන්ගේ සහ තනි පුද්ගලයන්ගේ විවිධ ආකාරයේ නින්දා සහගත සැලකීම් වලට මුහුණ දීමට ඉඩ තිබේ .එමඟින් ඔවුන්ගේ මානව හිමිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා කේන්ද්‍රීය වන දෛනික ජීවිතයේ ගුණාත්මක හා සුරක්ෂිතභාවය සහ සේවාවන්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව අභියෝගයට ලක් වේ.

හියුමන් රයිට්ස් වොච් විසින් මෙහෙයවූ 2015 ඔක්තෝබර් සිට 2016 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ නගර 4 ක සිටින සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් 61 දෙනෙකු සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා පදනම් කර ගෙන සකස් කර ඇති මෙම වාර්තාව, අත්තනෝමතික රඳවාගැනීම, අයුතු ලෙස සැලකීම සහ රැකියා, ගේ දොර සහ සෞඛ්‍යය පහසුකම් සඳහා ප්‍රවේශ වීමේදී මුහුණ දෙන විෂම සැලකීම ඇතුළු, මූලික වශයෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් අත්දකින නින්දා සහගත සැලකීම් පිළිබඳ අවධානය යොමු කරයි .තවද, සැබෑ හෝ ඇති යැයි විශ්වාස කරන ලිංගික දිශානතිය මත පුද්ගලයන් මුහුණ දෙන විෂම සැලකීම සහ නින්දා සහගත සැලකීම් වලට උදාහරණ මෙම වාර්තාවේ ඇතුලත් වේ .ඉන් බොහොමයක්, සමාජීය ස්ත්‍රී පුරුෂභාවයට අනුගත නොවීම පිළිබඳ ව ඇති නොපිළිගැනීම හා සම්බන්ධ ඒවාය.

මෙම වර්තාව, නින්දා සහගත ක්‍රියාමාර්ග වලින් තොරව සංක්‍රාන්ති සමාජභාවයක් සහිත පුද්ගලයන්ගේ සමාජභාවී අනන්‍යතාවය පිළිගැනීමට අපොහසත්; කැමැත්ත මත සිදු වන සම ලිංගික හැසිරීම් දණ්ඩනීය වරදක් බවට පත් කරන; සහ සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් විවිධ ආකාරයෙන් නින්දාවට ලක් කිරීමට ඉඩ සලසන පුළුල් නෛතික රාමුවක් තුළ, එවැනි නින්දා සහගත සැලකීම් පිළිබඳ සාකච්ඡා කරයි .

අවසන් වශයෙන්, සංහිඳියා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂක අංශයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීම සහ නව ව්‍යවස්ථාවක් අනුමත කර ගැනීම යන පියවර සමග, සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට හිංසනයෙන් සහ විෂම සැලකීමෙන් තොරව ජීවත් වීමට ඉඩ සැලසීම පිණිස ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ රජය විසින් සඳහා ගත යුතු ප්‍රතිසංස්කරණ අවශ්‍යතා මෙම වර්තාව මගින් පෙන්වා දෙයි .

## සමාජීය ස්ත්‍රී පුරුෂභාවට ඇති නෛතික පිළිගැනීම

සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගැනීම සඳහා වූ ක්‍රියාපටිපාටියක් පිළිබඳ සලකා බැලෙමින් තිබුණද, සමාජීය ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කර ගැනීම සඳහා පැහැදිළි මාර්ගයක් ශ්‍රී ලංකාවේ නීතියෙහි ඇතුළත් නොවේ .

ශ්‍රී ලංකාවේ ජීවත් වන සංක්‍රාන්ති පුද්ගලයන්ට සිය කැමැත්ත පරිදි ස්වකීය නම සහ සමාජීය ස්ත්‍රී පුරුෂභාවය ඇතුළත් ජාතික හැඳුනුම්පතක් හෝ සෙසු රාජකාරි ලියකියවිලි ලබා ගැනීමට අවස්ථාව ලැබෙන්නේ කලාතුරකිනි .එමනිසා ඔවුහු, ස්වකීය සමාජභාවී අනන්‍යතාවය පිළිබඳව, මුර කපොළු පොලිස් නිලධාරීන්, රජයේ රෝහල් සේවකයන්, සේවායන්, ගුවන්තොටුපළ සේවකයන් සහ බැංකු සේවකයන් ඇතුළු විවිධ පුද්ගලයන්ගේ අවමානයට මුහුණ දෙන පරීක්ෂාවන්ට නිරන්තරයෙන් ලක්වෙති .

නිල හැඳුනුම්පතේ ස්වකීය සමාජීය ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කර ගැනීමට බලාපොරෙත්තු වන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සිත කලබල කරවන තරමේ නිලධාරීවාදී අවහිරතා රාශියකට මුහුණ දෙති .සම්මුඛ සාකච්ඡා ලබා දුන් පුද්ගලයන්ට අනුව, රජයේ නිලධාරීන් විසින් නිල ලියකියවිලි වල සමාජීය ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් හසුරුවන්නේ ඉතා අවිධිමත් ආකාරයකට වන අතර කොටින්ම අයදුම් පත් ප්‍රතික්ෂේප ද කරයි .සෙසු සිදුවීම් වලදී, කාර්යංශ මගින් සමාජීය ස්ත්‍රී පුරුෂභාවී සංක්‍රාන්තියට සහ ලිංග සැකසීමේ සැත්කමට අදාල සාක්ෂි, කුඩා කාලයේදී හැසිරුණු ආකාරය පිළිබඳ විස්තර දැක්වෙන දෙමාපියන් විසින් ඉදිරිපත් කරන ලියවිලි ඉදිරිපත් කිරීමට සහ සිය සංක්‍රාන්තිය පිළිබඳ විවිධ රජයේ නිලධාරීන්ට නැවත නැවත විස්තර කිරීමට සිදු වීම ඇතුළු අත්තනෝමතික, වසන් කරන හෝ කරදරකාරී ක්‍රියාපටිපාටීන්ට මෙවුන්ව ලක් කරයි .

මෙම තත්ත්වය ඉවසාගෙන නොසිට ඇතැම් සංකාන්ති සමාජභාවී පුද්ගලයන් ජාතික මානව හිමිකම් කොමිසමට පැමිණිළි ඉදිරිපත් කර ඇත .එයට ප්‍රතිචාරයක් ලෙස, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත සහ විදේශ ගමන් බලපත්‍රය ඇතුළු නිල ලියකියවිලි වල දක්වා ඇති සමාජීය ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කර ගැනීමට අවස්ථාව සලසන ''සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගැනීමේ සහතිය''ක් යෝජනා කර ඇත .2016 ජූනි මාසයේදී සෞඛ්‍යය අමාත්‍යංශය විසින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගැනීමේ සහතිය නිකුත් කරන ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ දක්වමින් විවිධ සෞඛ්‍යය සේවා සහ අධ්‍යාපන ආයතන වලට චක්‍ර ලේඛයක් යවන ලදී . 2016 ජූලි වන විට ජාතික මානව හිමිකම් කවුන්සිලය යෝජිත සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගැනීමේ සහතිය පිළිබඳ රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තුමේන්තුවෙන් ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටී.[1]

මෙම යෝජිත සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගැනීමේ සහතිය ඉතා වැදගත් පියවරකි .කෙසේ වුවත්, මෙම සහතිය ලබා ගැනීම සඳහා වෛද්‍ය ප්‍රතිකාර වල සාක්ෂි සහ මනෝ චිකිත්සකවරයෙකුගේ සහතිකය ඇතුළු තවත් තොරතුරු අවශ්‍යය .එම නිසා, මෙම ක්‍රියාපටිපාටිය, සමාජීය ස්ත්‍රී පුරුෂභාවය නිල ලියකියවිලි වල වෙනස් කර ගැනීම සඳහා වෛද්‍යයම, ශෛල්‍යකර්මකයට අදාල හෝ මානසික සෞඛ්‍යය ප්‍රතිකාර හෝ රෝග විනිශ්චයක් අවශ්‍ය නැති බව පෙන්වා දෙන ජාත්‍යන්තර නිර්දේශ හා ගැලපෙන්නේ නැත .

1 Human Rights Watch email correspondence with MenakaHerath, National Human Rights Commission, July 7, 2016.

## නීතිය මගින් ආරක්ෂා නොවීම

ශ්‍රී ලංකාවේ කිසිම නීතියක් මගින් සංක්‍රාන්ති සමාජභාවී හෝ අන්තර් ලිංගික පුද්ගලයන් නීති විරෝධී තත්ත්වය පත් කර නොමැත .කෙසේ වුවත්, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන බව සහතික කරන නීතියක් ද නැත .එසේම, සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් විශේෂයෙන්ම ලිංගික වෘත්තියේ නියුතු සංක්‍රාන්ති කාන්තාවන් සහ පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් ඉලක්ක කර ගැනීම සඳහා පොලීසිය විසින් සාපරාධී ක්‍රියා වලට අදාල නීති සහ රෙගුලාසි ගණනාවක් යොදා ගැනේ .“අනෙකකු ලෙස පෙනී සිටීම මගින් රැවටීමට එරෙහි නිතිය” සහ “බලපතල අශෝබන ක්‍රියා” වලට අනුබල දීම සහ ඒවායේ යෙදීම හෝ නීති “විරෝධී හෝ අස්වාභාවික ලිංගික හැසිරීමේ” වල යෙදෙන “මුරණ්ඩු තක්කඩියන්” ලෙස හැසිරීම තහනම් කරන නොපැහැදිලි ලෙස ලියා ඇති අයාලේ යාමේ පනත එම නීති වලට ඇතුලත් වේ .

“අස්වාභාවික” හා “බරපතල අශෝබන ක්‍රියා” තහනම් කරන ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 365 සහ 365 අ වගන්ති, වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදු වන සම ලිංගික හැසිරීම් සාපරාධී ක්‍රියා බවට පත් කිරීමට පොදුවේ යොදා ගැනේ .සම ලිංගික ,ද්වි ලිංගික ,සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට නින්දා සහතගව සැලකීමට ඉහත දක්වන ලද සාපරාධී ක්‍රියා සහ රෙගුලාසි මගින් මහ ජනතාවට සහ රාජ්‍ය නිලධාරීන්ට ඉඩ සැලසේ .

හියුමන් රයිට්ස් වොච් සංවිධානය ලේඛනගත කර ඇති අත්තනෝමතික රඳවා ගැනීම සහ අයුතු ලෙස සැලකීම ඇතුළු මුහුණ දෙන නිරන්තර පොලිස් හිරිහැර හේතුවෙන්, රජයේ ආයතන පිළිබඳ විශ්වාසය සෝදා පාළුවට ලක් වී ඇති බවත් එමනිසා අපරාධයක් වාර්තා කිරීමෙන් වැළකී සිටීමේ ප්‍රවණතාවයක් ඇති බවත් ඇතැම් සංක්‍රාන්ති කාන්තාවන් සහ පිරිමි සමග ලිංගිකව හැසිරෙන පිරිමි කියා සිටියහ .“මං වගේ කෙනෙක්ව ඒ ගොල්ලෝ ආරක්ෂා කරන්නේ නෑ”, යනුවෙන් කොළඹ සිටින 25 වියැති සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් වන ලිංගික වෘත්තියේ යෙදෙන ෆාතිමා කියා සිටියේය .2012 වසරේදී මැරයන් විසින් ඇයට පහර දීමෙන් පසු ඇය පොලීසියට ගියේ නැත .

## සමාජීය ස්ත්‍රී පුරුෂභාවයට අනුගත නොවීම පිළිබඳ වූ විෂම සැලකීම

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් මුහුණදෙන නින්දා සහගත සැලකීම් ,ශ්‍රී ලංකාවේ සමාජීය ස්ත්‍රී පුරුෂභාවයට අනුගත නොවන පුද්ගලයන් මුහුණ දෙන පුළුල්ව පැතිරී ඇති විෂම සැලකීම් වල කොටසකි . රාජ්‍ය සහ පෞද්ගලික අංශයෙන් නිවාස ,රැකියා සහ සෞඛ්‍යය සේවා යනාදියට ප්‍රවේශ වීමේදී සම ලිංගික කාන්තාවන් ,සම ලිංගික පිරිමින් ,ද්වි ලිංගික ,සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් පොදුවේ කොන් කිරීම හා විෂම සැලකීමට මුහුණ දීමට ඉඩ තිබේ .තමාගෙන් අනවශ්‍ය පෞද්ගලික ප්‍රශ්න ඇසූ රජයේ රෝහලක සේවක මණ්ඩලය පිළිබඳ කතා කරමින් සංක්‍රාන්ති සමාජභාවී පිරිමියෙක් “ඒගොල්ලොන්ගේ වචන ඉදිකටු වලටත් වඩා තියුණුයි. ” යනුවෙන් පැවූවේය.[2]

ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය සේවා ආයතන විසින් එච්අයිවී වසංගතය ආමන්ත්‍රණය කිරීමේ දී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමි මූලික කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඇත.[3] කෙසේ වුවත්, කොන් කිරීම සහ විෂම සැලකීම තුළ එච්අයිවී නිවාරණ සහ ප්‍රතිකාර සේවා වලට ප්‍රවේශ වීම වැලැක්වීම ඇතුළු බරපතල සමාජීය සහ සෞඛ්‍යයමය ගැටළු ඇති විය හැකියි.

---

[2] Human Rights Watch interview with Krishan (pseudonym), Colombo, October 26,2015.

[3] National STD/AIDS Control Programme, “National Response to HIV/AIDS and Sexually Transmitted Infections in Sri Lanka: Mid Term Review 2013-2017 National Strategic Plan,” January/February 2015,

දුප්පතුන්, ලිංගික වෘත්තියේ යෙදෙන පුද්ගලයන් හෝ සමාජීය ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ඇති අනම්‍ය ප්‍රතිමාන නිසැකවම පිළිනොපදින පුද්ගලයන් ශාරීරික හිරිහැර සහ අත්අඩංගුවට ගැනීම ඇතුළු අපයෝජනයන්ට ලක් වීමට වැඩිම අවදානමක් ඇත. එමනිසා, සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් මුහුණදෙන විෂම සැලකීම තුළ සමාජය විසින් හොබවන ස්ථාවරය වැදගත් භූමිකාවක් රඟදක්වයි.

***

2015 වසරේදී මහින්ද රාජපක්ෂ රජය පෙරලා නව රජය බලයට පත් වූ දා සිටම ශ්‍රී ලංකාව සිටින්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් තුළය. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමාන රැකවරණය පිළිබඳ වූ වගන්තියට සමාජීය ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය යන කොටස් ඇතුළත් කිරීමට සහ ජීවත් වීමට, සෞඛ්‍යයට සහ පෞද්ගලිකත්වයට ඇති අයිතිය ඇතුළු ජාත්‍යන්තර නීතිය තුළ ආරක්ෂා වන ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවන සෙසු මූලික අයිතිවාසිකම් නව ව්‍යවස්ථාවය ඇතුළත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දේ.

සම ලිංගික හැසිරීම් සාපරාධී ක්‍රියාවක් බවට පෙන්වා ඇති අපරාධ නීති ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් වහාම ඉවත් කළ යුතුය. සංවේදීකරණ පුහුණු වැඩසටහන් සහ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය, සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය නොසලකා සියළුම පුද්ගලයන්ගේ අයිතීන්ට ගෞරව කිරීමට ඇති වගකීම පිළිබඳ සංවේදී පුහුණුව සහ පැහැදිළි මාර්ගෝපදේශ පොලීසියට අවශ්‍යය. එමෙන්ම, මෙම අයිතීන් ආරක්ෂා කිරීමට අපොහොසත් වන අවස්ථාවන් වලදී ඒ සම්බන්ධයෙන් වගකීම පැවරිය යුතුය. ශ්‍රී ලංකාවේ සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට සෞඛ්‍යය සඳහා ළඟා විය හැකි උපරිම තත්ත්වයන් ලබා ගැනීම සඳහා සෞඛ්‍යය සේවා පද්ධතිය තුළ සිටින වෛද්‍යවරුන්, හෙදියන්, වෙනත් වෛද්‍ය කාර්ය මණ්ඩල සහ සහය සේවක පිරිස් සඳහා වඩාත් හොඳ මට්ටමේ පුහුණු, මාර්ගෝපදේශ සහ වගවීමේ යාන්ත්‍රණයක් අවශ්‍යය.

සම ලිංගික**,** ද්වි ලිංගික සහ සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන් මුහුණ දෙන අනාරක්ෂිත බව සහ හිංසන, ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම මගින් ඇතුළු රටේ ජීවත් වන පුද්ගලයන්ගේ ආරක්ෂාව සහතික කිරීම රජයේ වගකීමකි. සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හෝ ලිංගික දිශානතිය නොසලකා**,** සෑම පුද්ගලයකුම සමාන ලෙස ගෞරවය ලැබීමට , ආරක්ෂාව ලැබීමට සහ අයිතීන් භුක්ති විඳීමට සුදුසු බව කියවෙන පැහැදිළි පණිවුඩයක් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් වෙත මෙන්ම ශ්‍රී ලංකාවේ ජීවත් වන සාමාන්‍ය ජනතාව වෙතද ලබා දීමට අදාල අධිකාරීන් කටයුතු කළ යුතුය.

---

http://www.aidscontrol.gov.lk/web/images/web_uploads/Guidelines_Reports_Publications/2015%20Mid%20Term%20Review%20Report%20of%20the%20Sri%20Lankan%20National%20Strategic%20Plan%20for%202013-2017.pdf (noting the “gradual development of prevention services for key populations” and that “[p]rogrammes addressing sex workers, men who have sex with men and transgendered people, and drug users are now in place.”) (accessedJuly 20, 2016).

# සම්පූර්ණ නිර්දේශ

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත

- සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව කෙරෙන විෂම සැලකීම් තහනම් කරන, එවැනි විෂම සැලකීම් හඳුනාගැනීම, වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා ඵලදායී ක්‍රියාපටිපාටියක් ඇතුළත්, විෂම සැළකීම් පිටු දකින පරිපූර්ණ නීති සම්පාදනය කර සම්මත කිරීම සහ කිරීම.
- කැමැත්ත මත වැඩිහිටියන් දෙදෙනෙකු අතර සිදු වන සම ලිංගික සම්බන්ධතා නීති විරෝධී කර ඇති ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රයේ 365 සහ 365අ යන වගන්ති, ලිංගික සේවා සැපයීමේ ඇතැම් ආකාර නීති විරෝධී කර ඇති 360අ වගන්තිය, සංක්‍රාන්ති සමාජභාවයක් සහිත පුද්ගලයන් සහ ලිංගික සේවයේ නිරත වන පුද්ගලයන් නීති විරෝධී කිරීමට යොදා ගත හැකි ආයාල ආඥා පණත, ලිංගික සේවා සපයන පුද්ගලයන් නීති විරෝධී කිරීමට යොදා ගත හැකි ගණිකා මඩම් පණත යන නීති සහ ආඥාපණක් අවලංගු කිරීම.
- පොලීසියේ අයුතු සැලකීම් පිළිබඳ වාර්තා කිරීම සඳහා රහස්‍යභාවය සහතික කරන, ඔවුන්ගේ පෞද්ගලිකත්ව අයිතියට ගරු කරන, සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් ඇතුළු පොලිස් අපයෝජන වලට මුහුණ දෙන වින්දිතයන්ට පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව ස්වාධීන පැමිණිලි යාන්ත්‍රණයක් සකස් කිරීම.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පාලන කමිටුව වෙත

- වර්ගය, ආගම, භාෂාව, කුළය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය, උපන් ස්ථානය සහ එවැනි පදනමක් මත විෂම සැලකීමෙන් ආරක්ෂා කරන ප්‍රතිපාදන අතරට නව ව්‍යවස්ථාව තුළ සමාජීය ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය පැහැදිළිව ඇතුළු කිරීම.
- රාජ්‍ය පාර්ශවකරුවෙකු ලෙස සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අදාලව ශ්‍රී ලංකාවට ඇති බැඳීම වලට අනුකූලව, ජීවත් වීමට ඇති අයිතිය, පෞද්ගලිකත්වයට ඇති අයිතිය සහ සෞඛ්‍යයට අදාල ඉහලම අත්කර ගැනීම් වලට ළඟා වීමට ඇති අයිතිය නව ව්‍යවස්ථාවට ඇතුළත් වන බවට සහතික වීම.

## අධිකරණ අමාත්‍යංශය වෙත

- සමාජීය ස්ත්‍රී පුරුෂ භාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව කෙරෙන විෂම සැලකීම් අවලංගු කරන විධිවිධාන ඇතුළත් විෂම සැලකීම් පිටු දකින පරිපූර්ණ නීති කෙටුම්පත් කිරීම.
- පෞද්ගලිකත්වය සහ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව කෙරෙන විෂම සැලකීම් පිළිබඳ ඇතුළු, ජාත්‍යන්තර ගිවිසුම් වලට අනුව ශ්‍රී ලංකාව අවශ්‍යයෙන්ම සිදු කළ යුතු කාර්යන් පිළිබඳ රජයට සහ රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් දීම.

## සෞඛ්‍යය අමාත්‍යංශය වෙත

- වෛද්‍යමය ක්‍රියා පටිපාටියකින් හෝ බලහත්කාරයෙන් තොරව ස්වයං ප්‍රකාශනය හරහා ඔවුන්ගේ නෛතික ස්ත්‍රී පුරුෂ භාවය සියළුම ලියකියවිලි වල වෙනස් කර ගැනීමට ඉඩ සැලසීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සාර්ථක භාවිතාවන්ට අනුකූලව සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගන්නා ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම. පෞද්ගලිකත්වය සහ මානව ගරුත්වය ආරක්ෂා වන ආකාරයට එම ලියකියවිලි සකස් කරන බවට එම ක්‍රියාපාටිය මගින් සහතික කළ යුතුය. මෙම ක්‍රියා පටිපාටිය සකස් කිරීමේදී විවිධ පසුබිම් වලින් එන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ අන්තර් ලිංගික පුද්ගලයන්, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ අන්තර් ලිංගික පුද්ගලයන් සමග කටයුතු කර අත්දැකීම් ඇති ප්‍රවීණයන්, ජාතික මානව හිමිකම් කොමිසම ඇතුළු කණ්ඩායම් ගණනාවක් සමග උපදෙස් ලබා ගැනීමේ සාකච්ඡා පැවැත්විය යුතුය.
- මෙම කණ්ඩායම් විශේෂයෙන් අරමුණු කර ගන්නා එච්අයිවී පිළිබඳ අධ්‍යාපන, නිවාරණ, උපදේශන, පරීක්ෂණ සහ ප්‍රතිකාර වැඩසටහන් වලදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් හා ඵලදායී ලෙස සම්බන්ධවීම.
- සියළුම වෛද්‍ය, හෙද සහ වෙනත් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා විෂම සැලකීමෙන් තොර වීම ගැන සහ සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට බලපාන සෞඛ්‍යය ගැටළු පිළිබඳව කොටසක් ඇතුළත් බව සහතික කිරීම.
- සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට අදාල සෞඛ්‍යය ගැටළු පිළිබඳ විශේෂඥයන් සහ සේවාවන් ශ්‍රී ලංකාව තුළදී ලබා ගත හැකි බව සහ එම සේවාවන් සහ විශේෂඥයන් වෙත ප්‍රවේශ විය හැකි අකාරය පිළිබඳ පැහැදිළි මාර්ගෝපදේශ වෛද්‍ය කාර්ය මණ්ඩලයට සහ රෝගීන්ට ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.
- ප්‍රජා මූල සංවිධාන සමග සහයෝගයෙන්, සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් පිළිබඳ ඇති කොන් කිරීම පිටු දැකීම අරමුණු කර ගෙන සෞඛ්‍යය සේවකයන් සඳහා සංවේදීකරණ වැඩසටහන් ඇති කිරීම.
- සම ලිංගික ලිංගික දිශානතිය, සම ලිංගික ආකර්ශනය, සම ලිංගික හැසිරීම සහ සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවය වෛද්‍යමය රෝග විනිශ්චයක් නොවන බවට, ජාත්‍යන්තර වෛද්‍යමය එකඟතාවයන්ට ගැලපෙන පැහැදිළි මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ගේ සෞඛ්‍යය (මානසික සෞඛ්‍යය ඇතුළු) අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීම සහ එම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා ව්‍යාපෘති සකස් කිරීම. එවැනි අවශ්‍යතා තක්සේරුවක් සිදු කළ යුත්තේ, ස්වෙච්ඡාවෙන් සහාගී වීමට කැමති නම් එයට අවස්ථා සලසමින් එමෙන්ම නිර්ණාමිකව සහ අනන්‍යතාවය ආරක්ෂා වන ආකාරයෙන් සහභාගී වීමට අවස්ථාව ලබා දෙමින්, සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් ගේ පෞද්ගලිකත්වයට සහ මානව ගරුත්වය රැකෙන ආකාරයෙනි.
- වෙනත් පොදු සේවාවන් තුළ ඇති සෞඛ්‍යය සේවාවන්ට ප්‍රවේශ වීමේදී ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පිහිටා සිදු වන විෂම සැලකීමට විරුද්ධව, ශක්තිමක් ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කිරීම.
- එච්අයිවී නිවාරණ සහ ප්‍රතිකාර සේවා සඳහා ඇති ප්‍රවේශය ඉහල නැංවීම සඳහා සම ලිංගික හැසිරීම් නීති ගත කිරීම වෙනුවෙන් අධිවාචනය කිරීම.

## කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යංශය වෙත

- සම ලිංගික සහ ද්වි ලිංගික ලෙස ස්වං නිර්ණය කර ගන්නා කාන්තාවන් සහ ගැහැණු ළමුන් මෙන්ම, කාන්තාවන් සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සමග ලිංගිකව හැසිරෙන කාන්තාවන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාකාරකම් සහ සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික සහ ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන සංවිධාන සමග උපදෙස් විමසීමේ සාකච්ඡා සංවිධානය කිරීම.
- සම ලිංගික සහ ද්වි ලිංගික ලෙස ස්වයං නිර්ණය කර ගන්නා කාන්තාවන් සහ ගැහැණු ළමුන් මෙන්ම, කාන්තාවන් සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සමග ලිංගිකව හැසිරෙන කාන්තාවන් අමාත්‍යංශයේ න්‍යාය පත්‍රයට සහ එහි ප්‍රතිපත්ති සහ වැඩසටහන් වලට ඇතුලත් කර ගැනීම.

## නීති හා සාමය පිළිබඳ අමාත්‍යංශය වෙත

- විෂම සැලකීමෙන් තොර වීමේ අයිතිය, සමානාත්මතාවය සහ පෞද්ගලිකත්වය සඳහා වූ අයිතීන්ට සියළුම පොලිස් නිලධාරීන් ගරු කරන බව සහ ස්වකීය රාජකාරිය තුළ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය සහ අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පිහිටා විෂම සැලකීම් සිදු නොකරන බව තහවුරු කිරීම සඳහා සුදුසු සියළු ක්‍රියාමාර්ග ගැනීම.

## පොලීසිය වෙත

- විෂම සැලකීමෙන් තොර වීමේ අයිතිය, සමානාත්මතාවය සහ පෞද්ගලිකත්වය සඳහා වූ අයිතියට සියළුම පොලිස් නිලධාරීන් ගරු කරන බව සහ ස්වකීය රාජකාරිය තුළ සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය සහ අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පිහිටා විෂම සැලකීම් සිදු නොකරන බව තහවුරු කිරීම සඳහා සුදුසු සියළු ක්‍රියාමාර්ග ගැනීම.
- විෂම සැලකීමෙන් තොර වීමේ අයිතිය, සමානාත්මතාවය සහ පෞද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කිරීමට අපොහොසත් වන හෝ සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට එරෙහි පහර දීම සහ අයුතු සැලකීම ඇතුළු සාපරාධී ක්‍රියා වලට සම්බන්ධ වන පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු නෛතික හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම.
- දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය අනුව "අනෙකකු ලෙස පෙනී සිටීම මගින් රැවටීමට එරෙහි නිතිය" යටතේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම පොලිස් නිලධාරීන්ට තහනම් කිරීම ඇතුළු ක්‍රියාමාර්ග මගින් සමාජීය ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය, සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය, ලිංගික දිශානතිය හෝ ලිංගික වෘත්තියේ යෙදීම මත පදනම්ව සිදු වන අත්තනෝමතික රඳවාගැනීම් අත්හිටුවීම.
- කාන්තාවක් ලෙස අනන්‍යතාවයක් (සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් සහ අන්තර් ලිංගික කාන්තාවන් ඇතුළු) ඇති පුද්ගලයෙක් නීත්‍යානුකූලව අත්අඩංගුවට ගන්නා සෑම අවස්ථාවකදීම පොලිස් කාන්තාවක් ඉදිරියේදී එය සිදු කිරීම සහ ඔවුන් කාන්තාවන් රඳවා තැබෙන කුටියේ හෝ පෞද්ගලිකත්වය සහ මානව ගරුත්වය රැකෙන පරිදි වෙනම කුටියක රඳවා තැබෙන බව සහතික කිරීම.
- ස්ත්‍රී පුරුෂභාවී ප්‍රකාශනය, ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය හෝ ලිංගික දිශානතිය මත පුද්ගලයන්ට එල්ල වන තර්ජන හෝ නින්දා පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සහ

වැරදිකරුවන් නීතියේ උපරිම බැඳීමට යටත් කරන, සාධාරණ සහ අපක්ෂපාත විමර්ශනයක් සිදු කරන බව සහතික කිරීම.

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ දැක්වෙන මූලික අයිතිවාසිකම් සහ සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් කෙරෙහි ඒවා ආදල වන ආකාරය පිළිබඳ, සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ සංවිධාන සමග සහයෝගයෙන් පොලිස් අණදෙන්නන් සහ පොලිස් නිලධාරීන් සඳහා සුදුසු පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- පොලිස් නිලධාරීන් විසින් සිදු කරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට වින්දිතයන්ට ඇති හැකියාව පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් සහ ලිංගික සේවා සපයන පුද්ගලයන් වැනි කොන් කිරීමට ලක් වී ඇති කණ්ඩායම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන වලට ළඟා වීම.
- ශ්‍රී ලංකාවේ ජීවත් වන සියළු පුද්ගලයන් ආරක්ෂා කිරීමට ඔවුන්ට ඇති වගකීම ඉටු කිරීම පිළිබඳ සමස්ථ පොලිස් බලකායටම පණිවුඩයක් ලබා දීම සඳහා සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් හිංසනයෙන් සහ විෂම සැලකීමෙන් ආරක්ෂා කිරීමට ක්‍රියාකාරී උත්සාහයන් ගන්නා පොලිස් නිලධාරීන් ප්‍රසිද්ධියේ හඳුනා ගැනීම සහ ප්‍රශංසාවට ලක් කිරීම.

## රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තුමේන්තුව වෙත

- වෛද්‍යාමය ක්‍රියා පටිපාටියකින් හෝ බලහත්කාරයෙන් තොරව ස්වයං ප්‍රකාශනය හරහා ස්වකීය සමාජීය ස්ත්‍රී පුරුෂ භාවය සියළුම ලියකියවිලි වල වෙනස් කර ගැනීමට ඉඩ සලසන සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගන්නා ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා .සෞඛ්‍යය අමාත්‍යාංශය සහ සෙසු රජයේ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
- වෙනස් කරන ලද, අළුතින් නිකුත් නොකළ සහතිකයක් නිසා, සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය පිළිබඳ ඇති වන නිරන්තර සහ නින්දා සහගත නිරීක්ෂණ මග හැරීම සඳහා නම හෝ/ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය වෙනස් කර ගැනීමට අයදුම් කරන පුද්ගලයන්ට නව උප්පැන්න සහතිකයක් නිකුත් කිරීම.
- සියළුම සේවක පුහුණු වැඩසටහන් තුළට, විශේෂයෙන් මහජනතාව සමග සම්බන්ධවී කටයුතු කරන සේවකයන් සඳහා වන පුහුණු සඳහා සමාජීය ස්ත්‍රී පුරුෂභාවය නීතිමය වශයෙන් පිළිගැනීම සහ විෂම සැලකීම තොර වීම පිළිබඳ කොටසක් ඇතුළු කිරීම සහතික කිරීම.

## පුද්ගලයන් ලිංයාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව, ආගමන විගමන දෙපාර්තුමේන්තුව වෙත

- වෛද්‍යාමය ක්‍රියා පටිපාටියකින් හෝ බලහත්කාරයෙන් තොරව ස්වයං ප්‍රකාශනය හරහා ජාතික හැඳුනුම්පතේ සහ විදේශ ගමන් බලපත්‍රයේ ස්වකීය සමාජීය ස්ත්‍රී පුරුෂ භාවය, වෙනස් කර ගැනීමට ඉඩ සලසන සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගන්නා ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශය සහ සෙසු රජයේ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

- සියළුම සේවක පුහුණු වැඩසටහන් තුළට, විශේෂයෙන් මහජනතාව සමග සම්බන්ධවී කටයුතු කරන සේවකයන් සඳහා වන පුහුණු සඳහා සමාජීය ස්ත්‍රී පුරුෂභාවය නීතිමය වශයෙන් පිළිගැනීම සහ විෂම සැලකීම තොර වීම පිළිබඳ කොටසක් ඇතුළු කිරීම සහතික කිරීම.

## ජාතික ලිංගාශ්‍රිත රෝග /ඒඩ්ස් මර්දන වැඩසටහන වෙත

- එච්අයිවී පිළිබඳ අධ්‍යාපන, නිවාරණ, උපදේශන, පරීක්ෂණ සහ ප්‍රතිකාර වැඩසටහන් වලදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් හා ඵලදායී ලෙස සම්බන්ධවීම.
- ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදු වන විෂම සැලකීම එච්අයිවී නිවාරණ සහ ප්‍රතිකාර වැඩසටහන් වලට ප්‍රවේශ වීමට ඇති බාධකයක් ලෙස ප්‍රසිද්ධියේ විවේචනය කිරීම.

## ජාතික මානව හිමිකම් කවුන්සිලය වෙත

- වෛද්‍යමය ක්‍රියා පටිපාටියකින් හෝ බලහත්කාරයෙන් තොරව ස්වයං ප්‍රකාශනය හරහා ස්වකීය සමාජීය ස්ත්‍රී පුරුෂ භාවය සියළුම ලියකියවිලි වල වෙනස් කර ගැනීමට ඉඩ සලසන සමාජීය ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගන්නා ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීමේ ක්‍රියාවලියට තවදුරටත් පහසුකම් සැලසීම සහ එය නිරීක්ෂණය කිරීම.
- නීති බලාත්මක කිරීමේ නිලධාරීන්ගෙන් සහ වෛද්‍ය වෘත්තිකයන්ගෙන්ඇතුළු සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට එරෙහි විෂම සැලකීම සහ හිංසනයට අදාල සිදුවීම් සමීපව නිරීක්ෂණය කිරීම.
- සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් සම්බන්ධයෙන් ඇති ජාතික සහ ජාත්‍යන්තර නීති වලට අනුකූලව ශ්‍රී ලංකා පොලිස් සේවය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ඔවුන් එම නීති පිළිපදිනවා දැයි නිරීක්ෂණය කිරීම.
- මහජනතාව, ජනමාධ්‍යවේදීන්, නීතිය සුරකින නිලධාරීන් සහ වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු මහජන සේවකයන් සඳහා සමාජීය ස්ත්‍රී පුරුෂභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය ඇතුළු විවිධත්වය පිළිගැනීම සහ ඒ කෙරෙහි වූ ගෞරවය ප්‍රවර්ධනය කිරීම ඇතුළත් දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව ජාතික මානව හිමිකම් කොමිසමට පැමිණිළි කිරීමට වින්දිතයන්ට ඇති හැකියාව පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා සම ලිංගික, ද්වී ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් වැනි කොන් කිරීමට ලක් වී ඇති කණ්ඩායම් නියෝජනය කරන සාමාන්‍ය ජනතාවට සහ සිවිල් සමාජ සංවිධාන වලට ළඟා වීම.

## ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලය, වෛද්‍ය සංගමය සහ මනෝ චිකිත්සක පාසල වෙත

- සම ලිංගික ලිංගික දිශානතිය, සම ලිංගික ආකර්ශනය, සම ලිංගික හැසිරීම සහ සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවය වෛද්‍යමය රෝග විනිශ්චයක් නොවන බවට, ජාත්‍යන්තර වෛද්‍යමය එකඟතාවයන්ට ගැලපෙන පැහැදිළි මාර්ගෝපදේශ නිකුත් කිරීම.

- සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති සහ අන්තර් ලිංගික පුද්ගලයන් ගේ සෞඛ්‍යය කෙරෙහි කොන් කිරීම සහ විෂම සැලකීම මගින් ඇති කරන බලපෑම පිළිබඳව වෛද්‍ය වෘත්තිකයන් වෙත චක්‍රලේඛ නිකුත් කිරීම.